# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2025 අංක 17 දරන
## සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 සැප්තැම්බර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2025 සැප්තැම්බර් 04 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 150.00** තැපැල් ගාස්තුව **: රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2025 අංක 17 දරන
# සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2025 සැප්තැම්බර් මස 03 වන දින]

එල්.ඩී. - ඕ 46/2023

**සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥාපනත, (46 වන අධිකාරය වූ) සූදු ආඥාපනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත ඉවත් කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් හඳුන්වනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන කෙටුම්පත පාර්ලිමේන්තුවේ පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** මේ පනතේ විධිවිධාන, 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් පවත්වනු ලබන ලොතරැයි, 1963 අංක 11 දරන මුදල් පනත යටතේ පිහිටුවා ඇති ජාතික ලොතරැයි මණ්ඩලය මගින් පවත්වනු ලබන ලොතරැයි සහ සමාජ සූදු ක්‍රීඩා හැර අනෙකුත් සියලුම වර්ගවල සූදු ක්‍රීඩා සඳහා අදාළ විය යුතු ය. මේ පනත අදාළ වීම

**3.** පනතේ අරමුණු- පනතේ අරමුණු

(අ) සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම;

(ආ) සූදු ක්‍රීඩාවලට අදාළ ආදායම් එකතු කිරීම සහතික කිරීම;

(ඇ) සූදු ක්‍රීඩා පවත්වාගෙන යාමේ දී ඒවායෙහි විනිවිදභාවය සහ යහපාලනය පිළිබඳව සහතික කිරීම;

(ඈ) නියාමනය කරන ලද සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් මෙහෙයුම් මගින් සංචාරක කටයුතු, රැකියා සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) සූදු ක්‍රීඩා කර්මාන්තයේ අඛණ්ඩතාවය සම්බන්ධයෙන් මහජනයාගේ විශ්වාසය ප්‍රවර්ධනය කිරීම;

(ඊ) සූදු ක්‍රීඩාව සාධාරණ හා විනිවිද පෙනෙන ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම;

(උ) සූදු ක්‍රීඩාවේ අඛණ්ඩතාවය සහ සාධාරණත්වය සහතික කිරීම සහ වගකීම් විරහිත සූදු ක්‍රීඩා නිෂ්පාදන සහ පිළිවෙත් තහනම් කිරීම.

(ඌ) අවම ප්‍රමිතියක් පවත්වාගෙන යාම සඳහා සහ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා සූදු ක්‍රීඩාවලට පහසුකම් ලබා දීම;

(එ) සූදු ක්‍රීඩාවෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා වගකීම් සහගත සූදු ක්‍රීඩා අභිවර්ධනය කිරීම;

(ඒ) සූදු ක්‍රීඩාවලට අදාළ නීති විරෝධි ක්‍රියාකාරකම් වැළැක්වීම;

(ඔ) සූදු ක්‍රීඩාව හා සම්බන්ධ සමාජ හානිය අවම කිරීම;

(ඕ) සූදු ක්‍රීඩාව අපරාධයක හෝ ව්‍යාකූලතාවයක ප්‍රභවයක් වීම වැළැක්වීම;

(ක) සුදු ක්‍රීඩා ක්‍රියාකාරකම් හෝ සුදු ක්‍රීඩාව හා සම්බන්ධ ක්‍රියාකාරකම්, අපරාධ මගින් උපයාගත් මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම; සහ

(ග) ළමුන් සුදු ක්‍රීඩාවෙන් ආරක්ෂා කර ගැනීම,

විය යුතු ය.

I වන කොටස

**සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම**

**4.** (1) (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**5.** අධිකාරියේ බලතල, පහත දැක්වෙන පරිදි විය යුතු ය:- අධිකාරියේ බලතල

(අ) සුදු ක්‍රීඩාවේ සංවර්ධනයට හිතකර ක්‍රමෝපාය ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ආ) සුදු ක්‍රීඩාවට අදාළ යම් බලපත්‍රයක් නිකුත් කිරීම, අලුත් කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම;

(ඇ) සුදු ක්‍රීඩා පරිශ්‍ර ලියාපදිංචි කිරීම සහ එම ලියාපදිංචිය අත්හිටුවීම අවලංගු කිරීම;

(ඇ) බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය සහ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක්

ඇති කර පවත්වාගෙන යාම සහ එම ශ්‍රේණිගත කිරීම් අධිකාරියේ නිල වෙබ් අඩවියේ පළ කිරීම;

(ඉ) බලපත්‍රලාභීන්ට විධාන නිකුත් කිරීම සහ බලපත්‍රය මත නියම සහ කොන්දේසි පැනවීම;

(ඊ) බලපත්‍රලාභීන්ට -

(i) සූදු ක්‍රීඩා ස්ථාන හෝ පරිශ්‍ර සහ සූදු ක්‍රීඩාව සහ සූදු ක්‍රීඩාව සඳහා සපයන සේවා සඳහා භාවිත කරන යම් ආනුෂංගික ගොඩනැගිලි භාවිත කිරීම; සහ

(ii) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන ප්‍රකාරව ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීම, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ගත යුතු පියවර සහ එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම,

සම්බන්ධයෙන් රීති සෑදීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(උ) මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි තොරතුරු, ලේඛන සහ පොත්පත් සපයන ලෙස හෝ මේ පනත යටතේ වන යම් සූදු ක්‍රීඩා ක්‍රියාකාරකමකට අදාළ යම් ගනුදෙනුවක් හෝ කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා නිශ්චිතව දක්වා ඇති වේලාවක දී මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිටින ලෙස

බලපත්‍රලාභියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට නියම කිරීම;

(ඍ) යම් සූදු ක්‍රීඩා ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ එම පරිශ්‍රයේ යම් ගොඩනැගිල්ලකට ඇතුළු වීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම;

(එ) මාර්ගගත සූදු ක්‍රීඩාවල යෙදෙන මාර්ගගත පිවිසුම්වලට ප්‍රවේශවීමට හෝ එම පිවිසුම්වල ඇති වෙබ් අඩවිවලට ඇතුළුවීමට අධිකාරිය විසින් බලය දෙන ලද යම් නිලධරයකුට අවසර දීම;

(ඒ) අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ අය කිරීම් අය කර ගැනීම;

(ඔ) කෙළින්ම හෝ අන්‍යාකාරයකින් තත්කාර්ය සඳහා අධිකාරිය විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් අධිකාරියේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම් හෝ එකඟතාවලට එළඹීම සහ ඒවා කිරීම හෝ ක්‍රියාවට නැංවීම;

(ඕ) එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, ඇප සහිතව හෝ රහිතව, මුදල් ණයට ගැනීම;

(ක) අධිකාරියේ අරමුණු සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීම සහ දැරීම හෝ අධිකාරිය විසින් මිලට ගනු ලැබූ හෝ දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ග) අධිකාරියේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන්, සේවකයන්

සහ අනුයෝජිතයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ච) අධිකාරියේ නිලධරයන් සහ සේවානියුක්තයන් පුහුණු කිරීම;

(ඡ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය විය හැකි යම් කමිටුවක් හෝ කමිටු පත් කිරීම; සහ

(ට) මේ පනතේ අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා හිතකර, හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම,

විය යුතු ය.

අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය

**6.** අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය -

(අ) සූදු ක්‍රීඩා මෙහෙයුම් නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම, මෙහෙයවීම සහ පාලනය;

(ආ) මේ පනත යටතේ නියාමනය කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සිදු කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම;

(ඇ) නීති විරෝධී සූදු ක්‍රීඩා සහ මේ පනත යටතේ නියාමනය කරනු ලබන යම් ක්‍රියාකාරකමක දී සිදු කරන වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සඳහා සහ සූදු ක්‍රීඩාවේ වංචා හඳුනාගැනීම සඳහා පොලිසිය සමඟ සම්බන්ධීකරණය කිරීම;

(ඈ) බලපත්‍රලාභීන් විසින් සුරක්ෂිත බව, සුවපහසු බව, සහ සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රමිති, ආරක්ෂාව, විනය සහ වංචා වැළැක්වීම ඇතුලු සියලුම අංශවල දී

ස්වකීය වගකීම් ඵලදායී ලෙස ඉටු කරන බවට වගබලා ගැනීම;

(ඉ) මුදල් විශුද්ධිකරණය සහ වෙනත් නීතිවිරෝධී මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන අවදානම් අනාවරණය ඇගයීම සඳහා අවදානම් තක්සේරුවක් සිදු කිරීම සහ සුදු ක්‍රීඩාව සම්බන්ධයෙන් එම අවදානම් අවම කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී පියවර ගැනීම;

(ඊ) සුදු ක්‍රීඩාවට අදාළ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විමර්ශනය සිදු කිරීම සහ එවැනි සුදුසු පියවර ගැනීම;

(උ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් රජයේ බැංකුවක හෝ රජයේ මූල්‍ය ආයතනයක ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු, ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම;

(ඌ) අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සුදු ක්‍රීඩාවලට අදාළ සියලුම විස්තර සහ ශ්‍රී ලංකාව තුළ එවැනි ක්‍රියාකාරකමක නියැලීම සහ පවත්වාගෙන යාම සඳහා ඇති අවශ්‍යතා ඇතුළත් නිල වෙබ් අඩවියක් නිර්මාණය කර එය පවත්වාගෙන යාම;

(එ) මේ පනතේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම,

විය යුතු ය.

II වන කොටස

**අධිකාරිය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම**

**7.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ පනතේ “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

(2) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් මේ පනතින් අධිකාරිය වෙත පිරිනමන ලද, පවරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය -

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම් -

(i) (මේ පනතේ ''ලේකම්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(iii) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයකු;

(iv) පොලිස්පතිවරයා හෝ ඔහුගේ නාමිකයකු; සහ

(ආ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, නීතිය හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යන ඕනෑම ක්ෂේත්‍රයක සුදුසුකම් සහ පළපුරුද්ද ඇත්තා වූ ද, සුදු ක්‍රීඩා නියාමනය සම්බන්ධයෙන් දැනුම ඇත්තා වූ ද තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා

**8.** (1) අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා, සභාපතිවරයා සභාපති ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධූර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරනු ලබන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවකට පත් වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව ස්වකීය ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට සභාපතිවරයාට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, වෙනත් සාමාජිකයෙකු ඔහුගේ ස්වකීය සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්වීමට නුසුදුසුකම්

**9.** (1) යම් තැනැත්තකු:-

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු ලෙස හෝ

බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ වස්තුභංගත්වයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු වන්නේ නම්;

(ඈ) මාස හයකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි දුරාචාරය සම්බන්ධ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳින්නේ නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) කෙළින්ම හෝ අන්‍යාකාරයකින් -

(i) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක ක්‍රියාත්මක වන සූදු ක්‍රීඩාවකින්;

(ii) යම් සූදු ක්‍රීඩා බලපත්‍රධාරියකුගේ ව්‍යාපාරයකින්; හෝ

(iii) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමකින්,

යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්;

(උ) අධිකාරිය විසින් අධිකාරිය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමකට යටත් වේ නම්;

(ඌ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්; හෝ

(එ) වයස අවුරුදු හැත්තෑවට වැඩි නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**10.** මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම මියයාමෙන්, ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී වන හෝ අනන්‍යාකාරයකින් වන වැඩිපුර ධුර කාල දෙකකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**11.** (1) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට, ඕනෑම අවස්ථාවක තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා, පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලයේ සේවය කිරීම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

(3) යම් පත් කළ සාමාජිකයකු මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ඔහුගේ ධුරය හිස්වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 7 වන වගන්තියේ (3) වන

උපවගන්තියේ (ආ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඔහු නොමැති කාලය තුළ ඔහුගේ ධුරයේ කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) නොපැමිණීමට හේතු සභාපතිවරයාට කලින් දැනුම්දීමෙන් තොරව මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු අපොහොසත් වන අවස්ථාවක එම සාමාජිකයා ස්වකීය ධුරය හිස් කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින්, 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

ගණපූරණය සහ මණ්ඩලයේ රැස්වීම්

**12.** (1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක් -

(අ) ගණපූරණයක් සංස්ථාපනය වන සාමාජිකයන් සංඛ්‍යාවක් මගින් රැස්වීම සඳහා නියම කරන ලද ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී; හෝ

(ආ) සහභාගීව සිටින ගණපූරණයක් සංස්ථාපනය වන, සියලු සාමාජිකයන්ට රැස්වීම පැවැත්වෙන කාලය තුළ සහභාගීව සිටින එක් එක් සාමාජිකයා එකවර දැනගැනීමට සහ සවන්දීමට හැකි වන ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයක් මාර්ගයෙන්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එම රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන

වන අවස්ථාවක දී සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු මණ්ඩලයේ එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීම්, කලින් කලට අධිකාරිය විසින් 77 වන වගන්තිය යටතේ සදනු ලබන රීති සහ කාර්ය පටිපාටිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වූ ලෙස නොසැලකිය යුතු බව

**13.** මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව

**14.** (1) අධිකාරියේ මුද්‍රාව -

(අ) කලින් කල මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමන් පැමිණි බවට සළකුණක් වශයෙන් සාධන පත්‍රයේ හෝ ලේඛනයෙහි අත්සන් කරනු ලැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ මුද්‍රාව යොදා ඇති සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

III වන කොටස

**සූදු ක්‍රීඩාව සඳහා බලපත්‍ර දීම සහ එම පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය**

සූදු ක්‍රීඩා සඳහා බලපත්‍ර දීම

**15.** (1) යම් තැනැත්තකු විසින් මේ පනතේ 39 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ මිස, සූදු ක්‍රීඩාව කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන බලය සම්බන්ධයෙන් වන බලතල, කාර්ය සහ කර්තව්‍ය යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

**16.** (1) මේ පනතේ විධිවිධාන යටතේ සූදු ක්‍රීඩාව කරගෙන යාම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන යම් තැනැත්තකු, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අවම ප්‍රාග්ධනයක් සහිත, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සමාගමක් විය යුතු ය.

(2) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම නියෝග මගින් නියම කල හැකි ආකෘතියකින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයකම අවශ්‍ය සියලු විස්තර සම්බන්ධයෙන් සම්පූර්ණ සහ නිරවද්‍ය තොරතුරු අන්තර්ගත විය යුතු අතර, නියම කරන ලද ගාස්තුව ද සමග එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයක අන්තර්ගත තොරතුරු සහ විස්තර සලකා බැලීමෙන් සහ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි අවශ්‍යතා ඉල්ලුම්කරු විසින් සපුරා ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, ඉල්ලුම්කරුට එකී බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (අ) බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සමාගමේ යෝග්‍යතාව සහ උචිත බව ඇගයීම සඳහා, නියම කල හැකි ආකාරයකින් (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සමාගමේ අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, කොටස් හිමියන්, ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස සහ ප්‍රතිලාභී අයිතිකරුවන් පිළිබඳ තොරතුරු සහ විස්තර සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(ආ) (අ) වන ඡේදය යටතේ වන තොරතුරු සහ විස්තර සලකා බැලීමෙන් පසු, සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, ජ්‍යේෂ්ඨ කළමනාකරුවකු, කොටස් හිමියකු, ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස හෝ ප්‍රතිලාභී අයිතිකරුවන් එම සමාගමේ එම තනතුර දැරීමට නුසුදුසු බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් -

(i) ඒ සඳහා හේතු දක්වා එම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම; හෝ

(ii) මේ වගන්තිය යටතේ එම තනතුර දැරීමට නුසුදුසු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තක්සේරු කරනු ලබන යම් තැනැත්තකු, බලපත්‍රය වලංගුව පවතින තාක් කල් සමාගමේ එම තනතුර නොදැරිය යුතු බවට වන කොන්දේසියට යටත්ව බලපත්‍රය නිකුත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(6) අසත්‍ය, නො මඟ යවන සුළු හෝ වැරදි තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට සොයා දැන ගනු ලැබූ ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය සඳහා වන ඉල්ලුම්පත්‍රය

**17.** (1) 16 වන වගන්තියේ විධිවිධාන යටතේ සූදු ක්‍රීඩාව කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් සමාගමක් වෙත ද, එවැනි යම් සමාගමක් විසින්, ඒ කාර්ය සඳහා, සූදු ක්‍රීඩා මෙහෙයුම් සිදු කරන පරිශ්‍රය, අධිකාරියේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පරිශ්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වූ ආකෘතියකින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක ම අවශ්‍ය සියලු විස්තර පිළිබඳ සම්පූර්ණ සහ නිරවද්‍ය තොරතුරු අන්තර්ගත විය යුතු අතර, නියම කරන ලද ගාස්තුව ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයක අන්තර්ගත තොරතුරු සහ විස්තර සලකා බැලීමෙන් පසු සහ ලියාපදිංචි කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි යෝග්‍යතාවයට අදාළ අවශ්‍යතා ඉල්ලුම්කරු විසින් සපුරා ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඉල්ලුම්කරුට පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) අසත්‍ය, නො මඟ යවන සුළු හෝ වැරදි තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට සොයා දැන ගනු ලැබූ ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

ඩිජිටල් සූදු ක්‍රීඩා

**18.** (1) බලපත්‍රලාභියකු හට ඩිජිටල් සූදු ක්‍රීඩා බලපත්‍රයක් ඇත්නම් මිස, ඔහු විසින් ඩිජිටල් සූදු ක්‍රීඩාව කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) 16 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, ඩිජිටල් සූදු ක්‍රීඩා බලපත්‍රයක් සඳහා අදාළ විය යුතු ය.

(3) බලපත්‍රලාභියකු විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කල හැකි ආකාරයකින් ඩිජිටල් සූදු ක්‍රීඩාව කරගෙන යනු ලැබිය හැකි ය.

බලයලත් සූදු ක්‍රීඩා

**19.** (1) අමාත්‍යවරයා විසින්, කලින්කල, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, මේ පනතේ විධිවිධාන යටතේ කරගෙන යාමට බලය දෙන ලද, ඩිජිටල් සූදු ක්‍රීඩා ඇතුළු සූදු ක්‍රීඩා වර්ග නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(2) කිසිම තැනැත්තකුට, මේ පනතේ විධිවිධාන යටතේ බලය දෙන ලද සූදු ක්‍රීඩා වර්ගයක් නොවන යම් සූදුවක් කරගෙන යාමට ඉඩ නොලැබිය යුතු ය.

සූදු ක්‍රීඩා රීති, ක්‍රීඩා ලැයිස්තුව සහ ඔට්ටු සංඛ්‍යාව

**20.** (1) සෑම බලපත්‍රලාභියකු විසින් ම, ක්‍රීඩා කිරීමට ලබා දී ඇති ක්‍රීඩාවල ලැයිස්තුවක් ද ඇතුළත් යෝජිත සූදු ක්‍රීඩා සඳහා වන රීති සහ නියෝග මගින් නියම කළ හැකි පරිදි වූ ආධාරක ලේඛනය ද සමඟ එක් එක් සූදු ක්‍රීඩාව සඳහා අවසර දී ඇති උපරිම ඔට්ටු සංඛ්‍යාව, අධිකාරියට ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉදිරිපත් කිරීමෙන් පසුව, අධිකාරිය විසින් මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීම සහතික කිරීම සඳහා එම යෝජිත රීති, සූදු ක්‍රීඩා ලැයිස්තු සහ උපරිම ඔට්ටු සංඛ්‍යාව සමාලෝචනය කළ යුතු ය.

(3) අධිකාරියට අවශ්‍ය නම්, නිශ්චිත කාලයක් තුළ බලපත්‍රලාභියාගෙන් වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිය හැකි ය.

(4) අධිකාරිය විසින් සම්පූර්ණ ඉදිරිපත් කිරීම ලැබීමෙන් පසුව සූදු ක්‍රීඩා රීති, ක්‍රීඩා ලැයිස්තුව සහ ඔට්ටු සංඛ්‍යාව ලිඛිතව අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමක් සඳහා වන ලිඛිත හේතු සන්නිවේදනය කිරීම කළ යුතු ය.

(5) එසේ ප්‍රතික්ෂේප කිරීමක් සිදු වුවහොත්, බලපත්‍රලාභියා විසින් අධිකාරිය විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු සකසන ලද සංශෝධිත රීති නැවත ඉදිරිපත් කළ හැකි ය.

(6) තොරතුරු ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය සහ ආකාරය, එවැනි ඉදිරිපත් කිරීමක් පරීක්ෂා කිරීම සඳහා වන ගාස්තු තිබේ නම් එම ගාස්තු, සමාලෝචනය සහ අනුමතය සඳහා වන කාල රාමුව, සූදු ක්‍රීඩා රීති අනුමත කිරීමේ නිර්ණායක, සූදු ක්‍රීඩා ලැයිස්තු සහ ක්‍රීඩා සඳහා වන උපරිම ඔට්ටු සංඛ්‍යාව නියෝග මගින් නියම කළ හැකි පරිදි විය යුතු ය.

බලපත්‍රය, පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය, රීති ආදිය ප්‍රදර්ශනය කිරීම

**21.** සෑම බලපත්‍රලාභියකු විසින් ම, සූදු ක්‍රීඩා පරිශ්‍රය සූදු ක්‍රීඩාව සඳහා විවෘතව ඇති සෑම අවස්ථාවක දී ම -

(අ) ඔහුගේ බලපත්‍රය සහ බලපත්‍රයේ කොන්දේසි;

(ආ) පරිශ්‍ර ලියාපදිංචි සහතිකය;

(ඇ) තරඟ කිරීමට බලය දී ඇති සූදු ක්‍රීඩා සහ අධිකාරිය විසින් අනුමත කරන ලද උපරිම ඔට්ටු සංඛ්‍යාව; සහ

(ඈ) අධිකාරිය විසින් අනුමත කරන ලද සූදු ක්‍රීඩා රීති,

පරිශ්‍රයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

සූදු ක්‍රීඩාවට අදාළ බලයලත් ගනුදෙනු

**22.** 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධානවලට හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් අවශ්‍යතාවයන්ට යටත්ව සූදු ක්‍රීඩාවට අදාළ යම් ගනුදෙනුවක්, සූදු ක්‍රීඩා මෙහෙයුම්කරු විසින් පිහිටුවන ලද මුදල් කවුන්ටරයක දී ව්‍යාවහාර මුදල්වලින් හෝ හර පතක් හෝ ණයවර පතක් මගින් සිදු කළ යුතු ය.

බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ආකෘතිය සහ කාලය

**23.** 16 වන සහ 17 වන වගන්ති යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සහ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයක් -

(අ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් විය යුතු ය;

(ආ) බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයේ නිශ්චිතව දක්වා ඇති යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය;

(ඇ) බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයේ නිශ්චිතව දක්වා ඇති යම් දිනයක සිට බලාත්මක විය යුතු ය; සහ

(ඈ) කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස, බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා බලාත්මක විය යුතු ය.

බලපත්‍රයක් සහ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම

**24.** (1) 16 වන සහ 17 වන වගන්ති යටතේ කලින් නිකුත් කරන ලද බලපත්‍රයක් සහ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් එම කලින් නිකුත් කළ බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයේ කාලය අවසන් වන දිනට දින තිහකට නොඅඩු කාලයකට පෙරාතුව, නියම කර ඇති අලුත් කිරීමේ ගාස්තුව ද සමඟ අධිකාරියේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ඒ කාර්ය සඳහා වන නියෝග මගින් නියම කර ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබීමෙන් අලුත් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට -

(අ) බලපත්‍රලාභියා විසින්, නිකුත් කළ බලපත්‍රයේ හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඇති නියම සහ කොන්දේසි උල්ලංඝනය කර හෝ උල්ලංඝනය කරමින් යම් දෙයක් කර නොමැති;

(ආ) බලපත්‍රලාභියා විසින් මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන උල්ලංඝනය කර නොමැති;

(ඇ) බලපත්‍රලාභියා විසින් 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ, 2006 අංක 5 දරන මුදල්

විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන හෝ ඒ පනත් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන උල්ලංඝනය කර නොමැති;

(ඇ) අදාළ සූදු ක්‍රීඩාව දිගටම කරගෙන යාමෙන් මහජනයාට යම් අහිතකර බලපෑමක් ඇති නොවන;

(ඉ) කිසිදු මහජන පැමිණිල්ලක් නොමැති; හෝ

(ඊ) අයිතිකරුට හෝ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, කොටස්හිමියකුට හෝ ප්‍රධාන කළමනාකරණ සේවක පිරිසට විරුද්ධව කිසිදු අපරාධ විමර්ශනයක් විභාග වෙමින් නොපවතින,

අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කරනු ලැබිය යුතු ය.

(3) 23 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ අලුත් කිරීමේ දී නිකුත් කරනු ලබන බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා අදාළ විය යුතු ය.

හේතු සන්නිවේදනය කළ යුතු බව

**25.** 16 වන, 17 වන හෝ 24 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ප්‍රතික්ෂේප කිරීමට හේතු සටහන් කළ යුතු ය. එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු, එම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ලද පුද්ගලයා වෙත, ලිඛිත සන්නිවේදනයක් මගින් ලියාපදිංචි තැපෑලෙන් එම ඉල්ලුම්පතෙහි සඳහන් ලිපිනයට දන්වා යැවීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ රාජකාරිය විය යුතු ය.

**26.** එවැනි බලපත්‍රයක්, පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක්, රීති, සූදු ක්‍රීඩා ලැයිස්තු සහ උපරිම ඔට්ටු සංඛ්‍යාව සංශෝධනය සඳහා වන ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් 16 වන, 17 වන සහ 20 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

බලපත්‍රයට හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයට සිදු කරනු ලබන සංශෝධන

**27.** බලපත්‍රයක් සහ බලපත්‍රය යටතේ වන අයිතිවාසිකම්, ප්‍රතිලාභ හෝ වරප්‍රසාද වෙනත් යම් තැනැත්තකුට මාරු කිරීම හෝ පැවරීම -

බලපත්‍රය පැවරීම මත වන සීමා කිරීම

(අ) මාරු කිරීම හෝ පැවරීම සඳහා බලය දෙන කොන්දේසියක් බලපත්‍රයේ අඩංගු වේ නම්; සහ

(ආ) මාරු කිරීමට හෝ පැවරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිත කැමැත්ත ලබා දෙන්නේ නම් සහ එම මාරු කිරීම හෝ පැවරීම මණ්ඩලය විසින් අනුමත කරන්නේ නම්,

මිස, කරනු නොලැබිය යුතු ය.

**28.** (1) බලපත්‍රලාභියා විසින්, ආයතනයේ පාලනයේ යම් වෙනසක් පිළිබඳ දැන්වීමක් එම වෙනස සිදුවී මාසයක කාලයක් ඇතුළත අධිකාරියට ලිඛිතව දැන්විය යුතු ය.

ආයතනික පාලනය වෙනස් කිරීම පිළිබඳ දැනුම් දීම

(2) මෙම වගන්තියේ අරමුණු සඳහා "ආයතනික පාලනය" යන්නට -

(අ) බලපත්‍රලාභියාගේ කොටස් හෝ ඡන්ද අයිතියෙන් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක අයිතිය වෙනස් වීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියේ වෙනසක් වීම;හෝ

(ඇ) නියෝග මගින් නියම කළ හැකි පරිදි වූ බලපත්‍රලාභියාගේ කළමනාකරණයට හෝ

ක්‍රියාකාරීත්වයට බලපෑම් කළ හැකි වෙනත් ඕනෑම වෙනසක්,

ඇතුළත් වේ.

බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීම

**29.** (1) අධිකාරිය විසින්, 16 වන හෝ 17 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයක් -

(අ) එය මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස පිළිගනු ලැබූ යම් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන;

(ආ) මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියා චෝදනා ලබා ඇති;

(ඇ) බලපත්‍රලාභියා විසින් මේ පනතේ, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ යම් විධිවිධානයක් හෝ ඒ පනත් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන උල්ලංඝනය කර ඇත්තා වූ ද එම උල්ලංඝනය කිරීමේ බරපතලභාවය බලපත්‍රය අවලංගු කිරීමකට බලය නොදෙන්නා වූ ද,

අවස්ථාවක දී, අත්හිටුවනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ

පනතේ, 2025 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පනතේ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ හෝ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන හෝ ඒ පනත් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන යටතේ වන වරදකට වරදකරු කරනු ලැබීමකට අදාළව (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීමට පෙරාතුව, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් පිහිටුවා ඇති මූල්‍ය බුද්ධි ඒකකය විමසිය යුතු ය; සහ

(ආ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබීමකට අදාළව (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීමට පෙරාතුව, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විමසිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටවනු ලැබූ අවස්ථාවක, බලපත්‍රය හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම සඳහා ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සමානුපාතික වශයෙන් ආපසු ලබා ගැනීමට බලපත්‍රලාභියාට හිමිකම් ලැබිය යුතු ය.

බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කිරීම

**30.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් 16 වන හෝ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් -

(අ) අසත්‍ය, නො මඟ යවන සුළු හෝ වැරදි තොරතුරු සැපයීමෙන් එම බලපත්‍රය ලබා ගෙන ඇති බවට තොරතුරු දැන ගනු ලැබ ඇති;

(ආ) බලපත්‍රලාභියා මේ පනතේ, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ හෝ ඒ පනත යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන යටතේ වන වරදකට වරදකරු කර ඇති;

(ඇ) එම බලපත්‍රය හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කර ඇත්තේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, එම නියම හෝ කොන්දේසි බලපත්‍රලාභියා විසින් කඩ කර හෝ උල්ලංඝනය කර ඇති; හෝ

(ඈ) සූදු ක්‍රීඩාව දිගටම ක්‍රියාත්මක වීමෙන් මහජනයාට අහිතකර බලපෑමක් සිදුවනු ඇති,

අවස්ථාවක, එය අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන හෝ ඒ පනත් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබීමකට අදාළව (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කිරීමට පෙරාතුව,

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය විමසිය යුතු ය; සහ

(ආ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝග, රීති, නියම හෝ විධාන යටතේ වරදකරු කරනු ලැබීමකට අදාළව (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි සහතිකයක් අවලංගු කිරීමට පෙරාතුව, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විමසිය යුතු ය.

හේතු දැක්වීම සඳහා වන දැන්වීම

**31.** (1) 29 වන හෝ 30 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමකට පෙර අධිකාරිය විසින් බලපත්‍රලාභියා වෙත එම ක්‍රියාවට හේතු දක්වා ලිඛිත දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් මගින් බලපත්‍රය හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු නොකළ යුත්තේ කුමන කරුණු හේතුවෙන් ද යන්න පිළිබඳව දැන්වීම ලැබුණු දින සිට මාසයක කාලයක් ඇතුළත හේතු දැක්විය යුතු ය.

(3) අවසාන තීරණයක් ගැනීමට පෙර බලපත්‍රලාභියා හට පෞද්ගලිකව හෝ බලයත් නියෝජිතයකු මාර්ගයෙන් කරුණු දැක්වීමට සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(4) බලපත්‍රලාභියා හෝ ඔහුගේ නියෝජිතයා විසින් ඉදිරිපත් කරන ලද යම් නියෝජනයන් සලකා බැලීමෙන් පසු, ලිඛිතව සටහන් තබන ලද හේතු මත අධිකාරිය බලපත්‍රය හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය.

අභියාචනා

**32.** (1) බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක්, අවස්ථාවෝචිත පරිදි, නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි එකී ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් එකී තැනැත්තාට දැනුම් දෙනු ලැබූ ලිඛිත සන්නිවේදනය ලැබූ දින සිට දින හැටක් ඇතුළත එම තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ තීරණය, එම අභියාචනය ලැබුණු දින සිට දින හැටක් ඇතුළත ලබා දිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් අභියාචනය ඉදිරිපත් කරන තැනැත්තා හට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දී එම තීරණය එම තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(3) ලේකම්වරයා විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් ලිඛිත තීරණයක් ගැනීමට පෙරාතුව, සිද්ධියේ අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය යයි ඔහු විසින් සළකන යම් පරීක්ෂණයක් සිදු කරනු ලැබිය හැකි අතර, ලේකම්වරයා විසින් එම තීරණය මාස දෙකක කාලයක් ඇතුළත ලබා දිය යුතු ය.

(4) ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් ඕනෑම තැනැත්තකු විසින් නීතිය පිළිබඳ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්, එම තීරණය සන්නිවේදනය කළ දින සිට දින තිහක් ඇතුළත අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකියි.

සූදු ක්‍රීඩා මෘදුකාංග

**33.** (1) මේ පනතේ 39 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මිස, යම් තැනැත්තකු විසින්, සූදු ක්‍රීඩා මෘදුකාංග සංවර්ධනය කිරීම, බෙදාහැරීම හෝ මෙහෙයවීම කරනු නොලැබිය යුතු ය.

(2) සූදු ක්‍රීඩා මෘදුකාංග බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක ම -

(අ) එකී සුදු ක්‍රීඩා මෘදුකාංගයේ අංගෝපාංග, කාර්යක්ෂමතාවය සහ අපේක්ෂිත භාවිතය ඇතුළුව සවිස්තරාත්මක විස්තර;

(ආ) එකී මෘදුකාංගය අදාළ ප්‍රමිතීන්ට අනුකූල බවට තහවුරු කරමින් පිළිගත් තුන්වන පාර්ශ්වීය විගණකවරුන් විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතික; සහ

(ඇ) දත්ත ආරක්ෂණ පියවර සහ අනවසර ප්‍රවේශයන්ට හෝ පරිහරණයට එරෙහිව වන ආරක්ෂක පියවර සම්බන්ධයෙන් වන තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(3) සුදු ක්‍රීඩා මෘදුකාංගයක් -

(අ) වාසි අවාසි හෝ ප්‍රතිඵල සම්බන්ධයෙන් පරිශීලකයන් නොමඟ යැවීම සඳහා නිර්මාණය කරන ලද යාන්ත්‍රණ ඇතුළත් නොවිය යුතු ය;

(ආ) සුදු ක්‍රීඩාවේ යෙදීම සඳහා වන නීත්‍යානුකූල වයසට වඩා අඩු තැනැත්තන්ට සහභාගීවීමට ඉඩලබා නොදිය යුතු ය;

(ඇ) බලපත්‍ර නොලත් හෝ අනවසර සුදු ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලකනු නොලැබිය යුතු ය; සහ

(ඈ) නියමිත අධිකාරිය විසින් විගණනය කර සහතික කරන ලද විනිවිදභාවයෙන් යුත් ඇල්ගොරිතම නොමැතිව ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(4) සංවර්ධනකරු හෝ බෙදාහරින්නා විසින් -

(අ) නියාමනය නොකළ මාර්ග වලින් සුදු ක්‍රීඩා මෘදුකාංගයක් ලබා ගැනීමට සැලැස්වීම හෝ බෙදාහැරීම, විකිණීම කරනු නොලැබිය යුතු ය;

(ආ) වලංගු සූදු ක්‍රීඩා බලපත්‍රයක් දරන අස්තිත්වයන්ට පමණක් මෘදුකාංගයට ප්‍රවේශ විය හැකි බවට වගබලාගනු ලැබිය යුතු ය.

(ඇ) සෑම සූදු ක්‍රීඩා මෘදුකාංගයක ම -

(i) වැය කරන මුදල, කාලය හෝ පාඩු සම්බන්ධයෙන් පරිශීලකයා විසින් ම පනවාගත් සීමා සහිත පරිශීලකයන්ට ප්‍රවේශවිය හැකි මෙවලම්;

(ii) සූදු ක්‍රීඩාවට ඇබ්බැහිවීමේ අවදානම් සම්බන්ධයෙන් වන කැපී පෙනෙන අවවාද සහ එය තහවුරු කිරීම සඳහා වන මූලාශ්‍රවලට අදාළ සබැඳි; සහ

(iii) ස්වයං බැහැරවීමේ වැඩසටහන්වල ලියාපදිංචි වී ඇති තැනැත්තන් විසින් ප්‍රවේශවීම හඳුනා ගැනීම සහ සීමා කිරීම,

ඇතුළත් වන බවට වගබලාගනු ලැබිය යුතු ය;

(ඈ) පරිශීලකයන්ගේ පෞද්ගලික සහ මූල්‍ය තොරතුරු ආරක්ෂා කිරීම සඳහා 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය; සහ

(ඉ) අනවසර දත්ත රැස්කිරීම්, බෙදා ගැනීම් හෝ උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා ආරක්ෂිත පියවර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම, බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම, බලපත්‍රයක ආකෘතිය සහ කාලය, බලපත්‍රය අලුත් කිරීම, හේතු දැනුම්දීම, බලපත්‍රයකට කරනු ලබන සංශෝධන, බලපත්‍රය පැවරීම සම්බන්ධයෙන් වන පරිසීමා, ආයතනයේ පාලනය වෙනස්වීම පිළිබඳ දැනුම්දීම, බලපත්‍රය අත්හිටුවීම,

බලපත්‍රය අවලංගු කිරීම, හේතු දැක්වීමේ දැන්වීම සහ අභියාචනා සම්බන්ධයෙන් වන 16 වන 21 වන සහ 23 වන වගන්තියේ සිට 32 වන වගන්තිය දක්වා වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සුදු ක්‍රීඩා මෘදුකාංග බලපත්‍රයක් සඳහා අදාළ විය යුතු ය.

නැව් තුළ සුදු ක්‍රීඩා කිරීම

**34.** (1) යම් නැවක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, එකී නැවේ හිමිකාරීත්වය දරන සමාගම හෝ චාටර් ගිවිසුම යටතේ එකී නැවේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පාලනය කරන නැව කුලියට ගන්නා තැනැත්තා සතුව මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තා වූ ද අවස්ථාවක, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, එම නැවට ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත සහ මහ මුහුදේ දී සුදු ක්‍රීඩාවල යෙදීමට අවසර ලබාදිය හැකි ය.

(2) යම් නැවක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර නොමැත්තා වූ ද, එකී නැවේ හිමිකාරීත්වය දරන සමාගම හෝ චාටර් ගිවිසුම යටතේ එම නැවේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පාලනය සිදු කරනු ලබන එම නැව කුලියට ගන්නා තැනැත්තා සතුව මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තා වූ ද අවස්ථාවක, නැවේ හිමිකාරීත්වය කුමක් වුව ද, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, එම නැවට එය ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත ඇති විට දී සුදු ක්‍රීඩාවේ යෙදීමට අවසර ලබාදිය හැකි ය.

විනෝද සවාරි සුදු ක්‍රීඩා බලපත්‍ර සහ මෙහෙයුම් කරුවන්

**35.** (1) යම් තැනැත්තකු විසින්, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරී බලය යටතේ මිස, විනෝද සවාරි සුදු ක්‍රීඩා මෙහෙයුම්කරුවකු ලෙස ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය, බලපත්‍රයක් ප්‍රදර්ශනය කිරීම, බලපත්‍රයක ආකෘතිය සහ කාලය, බලපත්‍රයක් අලුත් කිරීම, හේතු සන්නිවේදනය කළ යුතු බව, බලපත්‍රයට සිදු කරනු ලබන සංශෝධන, බලපත්‍රය පැවරීම මත වන සීමා, ආයතනයේ පාලනය වෙනස් කිරීම පිළිබඳ දැනුම් දීම, බලපත්‍රයක් අත්හිටු වීම, බලපත්‍රයක් අවලංගු කිරීම, හේතු දැක්වීම සඳහා වන දැන්වීම සහ අභියාචනා සම්බන්ධයෙන් 16 වන, 21 වන සහ 23 වන වගන්තිවල

සිට 32 වන වගන්තිය දක්වා වූ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම් බලපත්‍රයක් සඳහා ද අදාළ විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන සෑම ඉල්ලුම්කරුවකු ම, විනෝද සවාරි සූදු ක්‍රීඩා ව්‍යාපාරයක් මෙහෙයවීම සඳහා ඔහු සතු මූල්‍ය ස්ථායීතාව, අඛණ්ඩත්වය සහ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් කළ යුතු ය.

(4) සෑම විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවකු විසින් ම, ගනුදෙනුකරුවන් සහ මූල්‍යමය කටයුතු පිළිබඳ විස්තර ද ඇතුළුව, ඔහුගේ මෙහෙයුම්වලට අදාළ සියලු ගනුදෙනු සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරවද්‍ය සහ සම්පූර්ණ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුමක නිරතව සිටින සෑම බලපත්‍රලාභියකු විසින් ම, එකී විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවන් විසින් රැගෙන එනු ලබන සෑම ගනුදෙනුකරුවකු ම සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා ඇතුළු වීම සහ සහභාගී වීම සම්බන්ධයෙන් වන නෛතික අවශ්‍යතා සපුරා ඇති බවට වගබලා ගනු ලැබිය යුතු ය.

(6) යම් බලපත්‍රලාභියකු විසින්, විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවන් විසින් සිදු කරනු ලබන යම් සැකකටයුතු ක්‍රියාකාරකමක් හෝ යම් නියෝගයක් උල්ලංඝනය කිරීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(7) බලපත්‍රලාභී විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවන්ගේ මෙහෙයුම් විගණනය කිරීම, පරීක්ෂා කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය.

IV වන කොටස

**අධිකාරියේ අරමුදල**

අධිකාරියේ අරමුදල

**36.** (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට -

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් භාරගනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඇ) අධිකාරියේ බැරට උපචිත වූ සියලු මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණ සහ අරමුදලින් ගෙවීමට නියම කරන ලද සියලු මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**37.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත්පත් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වන විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම

**38.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ගිණුම් විගණනය හැර, අධිකාරියේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

### අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම

**39.** (1) (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ අනුමතය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තයන් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) එසේ කිරීම අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන කවර වූ හෝ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකාරියේ අනුමතය ඇතිව, මේ පනතේ තමා වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට පවරනු ලැබිය හැකි අතර, එකී නිලධරයා හෝ සේවා නියුක්තයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එකී බලය, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පවරන ලද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයට වගකිව යුතු අතර ඒ සම්බන්ධයෙන් පිළිතුරු දිය යුතු ය.

(5) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මත ස්වකීය ධුරයේ කාර්ය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නොහැකි වන කවර වූ හෝ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ඔහු නොමැති කාලය තුළ ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**40.** (1) මණ්ඩලය විසින්, තාක්ෂණික සහ පුහුණු සේවක පිරිස, පරිපාලන සහ කළමනාකරණ සේවක පිරිස සහ මණ්ඩලයට අවශ්‍ය කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තන් ද ඇතුළුව, අධිකාරියට පවරා ඇති බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් කාර්ය මණ්ඩලයක් සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමික

(2) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සහ අධිකාරියේ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

**41.** (1) අධිකාරියේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කළ හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවකයන් පත්කර ගැනීම

(2) යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කර ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු සඳහා සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කර ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු සඳහා සහ ඔහු සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ගිවිසුමකට එළඹී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලසීමාවක්, එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය

සඳහා රජයට සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

VI වන කොටස

**වැරදි**

බලපත්‍රයක් නොමැතිව සූදු ක්‍රීඩා කිරීම

**42.** පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක් නොමැතිව යම් සූදු ක්‍රීඩාවක් කරගෙන යන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අසත්‍ය, නොමඟ යවන සුලු හෝ වැරදි තොරතුරු සැපයීම

**43.** අසත්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි තොරතුරු සැපයීමෙන් හෝ යම් වැදගත් තොරතුරක් සැපයීම නොකර හැරීමෙන් බලපත්‍රය ලබාගෙන ඇති බවට සොයාගෙන ඇති බලපත්‍රලාභියකු, වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නීති විරෝධී සූදු ක්‍රීඩා ප්‍රචාරණය කිරීම

**44.** මේ පනතේ විධිවිධානවලට පටහැනිව යම් සූදු ක්‍රීඩාවක් ප්‍රචාරණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අනුමත සූදු ක්‍රීඩා පරිශ්‍රයෙන් පිටත සූදු ක්‍රීඩා ක්‍රියාත්මක කිරීම ආදිය

**45.** අධිකාරියේ ලියාපදිංචි කර නොමැති යම් පරිශ්‍රයක් තුළ හෝ එවැනි පරිශ්‍රයක සිට යම් සූදු ක්‍රීඩාවක් කරගෙන යන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු විසින් නීතිවිරෝධී සූදු ක්‍රීඩා සඳහා එම පරිශ්‍රය භාවිත කිරීම හෝ භාවිත කිරීමට ඉඩ දීම

**46.** මේ පනතේ විධිවිධානවලට පටහැනිව යම් පරිශ්‍රයක යම් සූදු ක්‍රීඩාවක් පවත්වාගෙන යනු ලබන, භාවිත කරන හෝ එසේ භාවිත කිරීමට ඉඩ දෙන යම් පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නීති විරෝධී සූදු ක්‍රීඩා සංවිධානය කිරීමේ වරද

**47.** මේ පනතේ විධිවිධානවලට පටහැනිව පවත්වාගෙන යනු ලබන යම් සූදු ක්‍රීඩාවක් සංවිධානය කරන හෝ කළමනාකරණය කරන හෝ සංවිධානය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා සහාය වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නීති විරෝධී සූදු ක්‍රීඩා සඳහා මුදල් සැපයීමේ වරද

**48.** මේ පනතේ විධිවිධානවලට පටහැනිව පවත්වාගෙන යනු ලබන යම් සූදු ක්‍රීඩාවක් සංවිධානය කිරීමේ හෝ හැසිරවීමේ ක්‍රියාවලියේ දී ගන්නා ලද යම් පියවරක් සඳහා මුදල් සපයන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ

ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නීති විරෝධී සූදු ක්‍රීඩා ස්ථානයක සිටීමේ වරද

**49.** මේ පනතේ විධිවිධානලට පටහැනිව පවත්වාගෙන යනු ලබන සූදු ක්‍රීඩා පරිශ්‍රයකට දැනුවත්ව හෝ විශ්වාස කිරීමට හේතු සහිතව ඊට ඇතුළත් වන , රැඳී සිටින සහ එහි සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

තහනම් හෝ අනුමත නොකළ සූදු ක්‍රීඩා යන්ත්‍ර භාවිතය

**50.** යම් තැනැත්තකු විසින් සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් කිරීමේ කාර්යය සඳහා වෙනත් පුද්ගලයකු මගින් යම් තහනම් සූදු ක්‍රීඩා යන්ත්‍රයක් සම්බන්ධ වන සූදු ක්‍රීඩාවක් කරගෙන යන හෝ යම් තහනම් සූදු ක්‍රීඩා යන්ත්‍රයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ සිට භාවිත කරන හෝ මෙහෙයවන හෝ භාවිත කිරීමට හෝ මෙහෙයවීමට ඉඩදෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය, බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නියමිත වයසට අඩු තැනැත්තන් සමඟ සූදු ක්‍රීඩා කිරීම

**51.** වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු සමඟ සමාජ සූදු ක්‍රීඩා නොවන සූදු ක්‍රීඩාවල යෙදෙන හෝ වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු වෙනුවෙන් වෙනත් තැනැත්තකු සමඟ සමාජ සූදු ක්‍රීඩා නොවන සූදු ක්‍රීඩාවල යෙදෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**52.** ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවේ සිට වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකුට සූදු ක්‍රීඩාවේ යෙදීමට ඉඩදෙන යම් බලපත්‍රලාභියකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

තහනම් වයස

**53.** ඒ තැනැත්තා විසින් යොදන ලද වැඩපිළිවෙළකට අනුකූලව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ සිට සූදු ක්‍රීඩා මෙහෙයුමක් කරගෙන යාම සඳහා වයස අවුරුදු විසිඑකට අඩු තැනැත්තකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අවුරුදු විසි එකට අඩු තැනැත්තන් නීතිවිරෝධී ලෙස සූදු ක්‍රීඩා සේවයේ නියුක්ත කිරීම

**54.** (අ) සූදු ක්‍රීඩාවේ ස්වභාවය, අවදානම හෝ ජයග්‍රහණය කිරීමේ අවස්ථා හා සම්බන්ධ, වැරදි, රැවටිලිකාර හෝ නො මඟ යවන සුළු තොරතුරු ඇතුළත්; හෝ

(ආ) සූදු ක්‍රීඩාවලට සහභාගි වීම මූල්‍ය දුෂ්කරතා විසඳා ගැනීමට හෝ සමාජ තත්ත්වය දියුණු කර ගැනීමට හැකිවන බව ගම්‍ය වන,

යම් සූදු ක්‍රීඩාවක් සඳහා වන වෙළෙඳ දැන්වීමක් ප්‍රකාශයට පත් කරන, විකාශනය සිදු කරන හෝ ප්‍රචාරණය සිදු කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

නොමග යවන සුළු වෙළෙඳ දැන්වීම් තහනම් කිරීම

සාමාන්‍ය වැරදි

**55.** මේ කොටසේ සඳහන් විධිවිධාන හැර මේ පනතේ යම් විධිවිධානයක් හෝ එම විධිවිධානය යටතේ පනවනු ලබන යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝග, රීති, විධාන හෝ මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් කටයුතු කරන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

අතිරේක දඩය

**56.** යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක, සිදු කරන ලද සුදු ක්‍රීඩා ක්‍රියාකාරකම, එකී ක්‍රියාකාරකම සඳහා ගත කළ කාලය, එකී ක්‍රියාකාරකමේ ස්වභාවය සහ බරපතළභාවය සහ එම ක්‍රියාකාරකමෙන් මහජනයාට ඇති වූ හානිය සලකා බැලීමෙන් පසු මේ පනතේ වෙනත් යම් වගන්තියක් යටතේ ඔහු යටත් විය හැකි යම් දඩයකට හෝ බන්ධනාගාරගත කිරීමේ කාලයකට අමතරව, එකී වරදකරු රුපියල් මිලියන එකකට නොඩැව් දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

**57.** (1) මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ වන විමර්ශන, නඩු කටයුතු පැවරීම, වැරදි සම්බන්ධයෙන් වන නඩු විභාග සහ මේ පනතේ එවැනි යම් නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරනු ලබන නඩු තීන්දු සඳහා වන අභියාචනා, දණ්ඩන නියම සහ ආඥාවන් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින්, මේ පනත යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර රැස්කරගන්නා කරුණු සැලකිල්ලට ගෙන යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන යටතේ වරදක් සිදු කර ඇති බවට සෑහීමකට පත්වන්නේ නම්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වන වගන්තිය ප්‍රකාරව අපරාධ නඩු කටයුතු පැවරීමට පියවර ගනු ලැබිය හැකි ය.

**58.** (1) මේ පනත යටතේ වන සියලු වැරදි අසා විභාග කොට, නිශ්චය කිරීමේ බලය මහෙස්ත්‍රාත් අධිකරණය සතු විය යුතු ය. අධිකරණ බලය

(2) (1) උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් බරපතල කරුණු හෝ මහජන කැළඹීමක් ඇති විය හැකි ආකාරයේ කරුණු පවතින අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත සෘජුවම අධිචෝදනා පත්‍රයක් යැවීම නීත්‍යානුකූල විය යුතු ය.

## VII වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

**59.** බලපත්‍රලාභියකු විසින්, සුදු ක්‍රීඩා දිනයක් තුළ දී වන මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම්, ව්‍යවහාර මුදල්වලින් සිදු කරන එක් එක් ගනුදෙනු, යම් සැකකටයුතු ගනුදෙනු, විශාල ප්‍රමාණයේ මුදල් ගනුදෙනු, ඉලෙක්ට්‍රොනික මුදල් මාරු කිරීම් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ඇතුළු ගනුදෙනුකරුවන්ගේ සියලු විස්තර පිළිබඳ වාර්තාවක් තබා ගනු ලැබිය යුතු ය. වාර්තා තබා ගැනීමේ නියමය

**60.** (1) මණ්ඩලය හෝ තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා බලය පවරන ලද අධිකාරියේ වෙනත් යම් නිලධරයකු විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝග, රීති, විධාන හෝ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීමේ කාර්යය සඳහා පොත්පත්, ලේඛන, වාර්තා සහ ලියකියවිලි පරීක්ෂා කිරීම සහ බලපත්‍රලාභියකුගේ ව්‍යාපාරය සහ කටයුතු පිළිබඳ ව විමර්ශනය කිරීම හෝ සාම නිලධරයකු සමඟ සුදු ක්‍රීඩා ස්ථානයක් හෝ පරිශ්‍රයක් සෝදිසි කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ කාර්ය සඳහා:- පොත්පත්, වාර්තා පරීක්ෂා කිරීම සහ සුදු ක්‍රීඩා පරිශ්‍ර සෝදිසි කිරීම සඳහා වන බලය

(අ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා අදාළ පොත්පත්, ලේඛන, වාර්තා සහ ලියකියවිලි ඇති බවට සාධාරණ

හේතු මත මණ්ඩලය හෝ බලයලත් නිලධරයා විශ්වාස කරනු ලබන යම් පරිශ්‍රයකට යම් යුක්ති සහගත වේලාවක දී ඇතුළු වනු ලැබිය හැකි ය;

(ආ) පද්ධතියේ අන්තර්ගත හෝ පද්ධතියෙන් ලබාගත හැකි යම් දත්තයක් පරීක්ෂා කිරීම සඳහා, පරිශ්‍රයෙන් සොයාගනු ලැබූ යම් පරිගණක පද්ධතියක් හෝ දත්ත පිරිසැකසුම් පද්ධතියක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි ය;

(ඇ) මුද්‍රිත හෝ වෙනත් ස්පර්ශ කළ නොහැකි නිමැවුමක ස්වරූපයේ දත්තවලින් යම් වාර්තාවක් ප්‍රතිජනනය කිරීම හෝ ප්‍රතිජනනය කිරීමට කටයුතු සැලැස්වීම සහ පරීක්ෂා කිරීම හෝ පිටපත් කිරීම සඳහා එම මුද්‍රිත හෝ නිමැවුම ඉවත් කර ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඈ) යම් පොතක, ලේඛනයක, වාර්තාවක හෝ ලියකියවිල්ලක පිටපත් ලබා ගැනීම සඳහා, පරිශ්‍රයේ ඇති යම් පිටපත් කිරීමේ උපකරණයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි ය; සහ

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ නඩු පැවරීම සඳහා ප්‍රයෝජනවත් වන හෝ අදාළ වන, යම් සෝදිසි කිරීමක් අතරතුර දී සොයාගත් වෙනත් යම් දෙයක් පිළිබඳ සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සකසනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සෝදිසි කිරීම් සම්බන්ධයෙන් වන විධිවිධාන, මේ වගන්තිය යටතේ වන සෝදිසි කිරීම් සඳහා ද හැකි තාක් දුරට අදාළ විය යුතු ය.

(2) මේ උපවගන්තියේ "සාම නිලධරයා" යන්නට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ බලය පවරන ලද නිලධරයා විසින් එම බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන අවස්ථානුගත කරුණු වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් සූදු ක්‍රීඩා පරිශ්‍රයෙන් යම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියකියවිල්ලක් තම සන්තකයට ගනු ලැබූ අවස්ථාවක, එවැනි යම් අයිතමයක් තම සන්තකයට ගනු ලැබූ නිලධරයා විසින්, තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියකියවිල්ලක් නිශ්චිතව දක්වමින් සූදු ක්‍රීඩා පරිශ්‍රයේ වගකීම දරන තැනැත්තා වෙත සටහනක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ බලය පවරන ලද නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියකියවිල්ලක්, එම පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියකියවිල්ල පරීක්ෂා කිරීම හෝ එම පොත, ලේඛනය, වාර්තාව හෝ ලියකියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් කල් තම සන්තකයේ තබා ගනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් පරිශ්‍රයේ හිමිකරු හෝ වගකීම දරන තැනැත්තා සහ එහි සිටිය දී සොයා ගනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මණ්ඩලයට හෝ යම් බලය පවරන ලද තැනැත්තකුට ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට හැකියාව ලබා දීම සඳහා සියලු යුක්ති සහගත සහාය ලබා දෙනු ලැබිය යුතු අතර, මේ පනත හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝග, නීති, විධාන හෝ මාර්ගෝපදේශ පරිපාලනය කිරීම සඳහා ඔවුන්ට යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි යම් තොරතුරු සපයනු ලැබිය යුතු ය.

තොරතුරු හුවමාරු කර ගැනීම

**61.** (1) 60 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන පරීක්ෂණවලින් ලබාගත් තොරතුරු සැක සහිත බවට හෝ එම තොරතුරු, මේ පනතට, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය

වැළැක්වීමේ පනතට, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතට හෝ ඒ පනත් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියෝගවලට, රීතිවලට, නියමවලට හෝ විධානවලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වන විමර්ශනයකට අදාළ බවට හෝ එම තොරතුරු මගින් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය වන වරදක් සිදු වන බවට විශ්වාස කිරීමට මණ්ඩලයට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක, මණ්ඩලය විසින්, එම තොරතුරු උචිත නියාමන අධිකාරීන්ට, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන්ට හෝ අධීක්ෂණ අධිකාරීන්ට සපයනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තොරතුරු හුවමාරු කර ගැනීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, උචිත නියාමන අධිකාරීන්, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් හෝ අධීක්ෂණ අධිකාරීන් සමග යම් ගිවිසුමකට එළඹෙනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය විසින් සංඛ්‍යාලේඛන සකස් කරනු ලැබිය යුතු අතර, මුදල් අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය සමග තොරතුරු හුවමාරු කරගනු ලැබිය හැකි ය.

(4) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි සපයනු ලබන හෝ හුවමාරු කරගනු ලබන යම් තොරතුරු සඳහා අදාළ විය යුතු ය.

තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මණ්ඩලය විසින් එළඹෙනු ලබන ගිවිසුම් සහ වැඩපිළිවෙළ

**62.** (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, අධිකාරිය සහ මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ ආයතන අතර තොරතුරු හුවමාරු කරගැනීම සම්බන්ධයෙන්-

(අ) අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට සමාන බලතල, කර්තව්‍ය සහ කාර්ය ඇති, විදේශීය

රාජ්‍යයක ආයතනයක් හෝ නියෝජිත ආයතනයක් හෝ විදේශීය රාජ්‍යයක රජයක් විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානයක්; සහ

(ආ) විදේශීය නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක්;

සමඟ ලිඛිතව ගිවිසුමකට හෝ වැඩපිළිවෙළකට එළඹිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හුවමාරු කරගනු ලබන තොරතුරු, නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය වන වරදක් හෝ මේ පනත යටතේ එවැනි වරදකට සාරානුකූල ලෙස සමාන වරදක් සම්බන්ධයෙන් වන විමර්ශනයකට හෝ නඩු පැවරීමකට අදාළ වන බවට සැක කිරීමට මණ්ඩලයට යුක්ති සහගත හේතු ඇති තොරතුරු විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ එළඹෙනු ලබන යම් ගිවිසුමකට හෝ වැඩපිළිවෙළකට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතු ය:-

(අ) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් හෝ එකී වරදට සාරානුකූල ලෙස සමාන වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ හෝ නඩු පැවරීමේ අරමුණට අදාළව තොරතුරු භාවිත කිරීම සම්බන්ධයෙන් වන සීමා කිරීම්; සහ

(ආ) තොරතුරු සම්බන්ධයෙන් රහස්‍ය ආකාරයකින් කටයුතු කළ යුතු බවට සහ මණ්ඩලයේ ප්‍රකාශිත කැමැත්ත නොමැතිව තොරතුරු වැඩිදුරටත් හෙළිදරව් නොකළ යුතු බවට වන කොන්දේසිය.

**63.** (1) යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝගයක්, රීතියක්, නියමයක් හෝ විධානයක් උල්ලංඝනය කරමින් දඩයක් පැනවීම

කටයුතු කර ඇති බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ප්‍රමාණවත් හේතු ඇති අවස්ථාවක, ඔහු විසින්:-

(අ) මේ පනතේ 66 වන වගන්තිය යටතේ පත් කරනු ලබන විශේෂඥ මණ්ඩලයේ නිර්දේශය මත; සහ

(ආ) පළමුවරට වරදකරු වීම සම්බන්ධයෙන් වන විට, වරද සිදු කළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්,

දඩයක් පැනවීම උචිත වන අවස්ථාවක, එකී දැන්වීම ලැබුණු දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත තමාට දඩයක් නොපැනවිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දක්වන ලෙස නියම කරමින්, නියෝග මගින් නියම කරනු ලබන ආකෘතියකින් එම තැනැත්තා වෙත දැන්වීමක් භාර දීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

(2) දැන්වීම භාරදෙනු ලැබුවේ යම් තැනැත්තෙකු වෙත ද එම තැනැත්තා විසින් මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝගයක්, රීතියක්, නියමයක් හෝ විධානයක් උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලැබූ බවට එකී දැන්වීම ලැබුණු දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත පිළිගනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් දඩයෙන් යටත් වන්නා වූ, මේ පනත යටතේ පැනවිය හැකි උපරිම දඩයන් තුනෙන් එකක් නොඉක්මවන මුදල් දඩයක් ඒ තැනැත්තාට පනවනු ලැබිය යුතු ය.

(3) (අ) දැන්වීම භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා විසින් එම දැන්වීම ලැබුණු දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත පෙනී සිට, එම දඩය පැනවීමට විරුද්ධව හේතු දැන්වීමට ඇති බව ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වහාම එම කරුණ විභාග කර ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දීම සඳහා ඉදිරි කටයුතු කරනු ලැබිය හැකි ය.

(ආ) දන්වන ලද හේතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් නොවන අවස්ථාවක, ඔහු විසින්, ඒ සඳහා හේතු දැක්වීමෙන් පසු, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දඬය පනවනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් නියෝගයක්, රීතියක්, නියමයක් හෝ විධානයක් උල්ලංඝනය කිරීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරා විසින් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට මුදල් දඩයක් පනවනු ලැබූ අවස්ථාවක, ඔහු විසින්, නියෝග මගින් නියම කරන ලද ලබන ආකෘතියකින් එම තීරණය එම තැනැත්තාට භාර දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, (3) වන උපවගන්තිය යටතේ ලබාදුන් එකී තීරණය ලැබුණු දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(6) ලේකම්වරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය සහ වරද සිදු කළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙනු ලැබිය යුතු අතර ඔහු විසින්:-

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයට ඉඩ දීම, එම තීරණය වෙනස් කිරීම හෝ එම තීරණය සුළු වශයෙන් වෙනස් කර ඒ අනුව කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කිරීම; හෝ

(ආ) එහි සඳහන් හේතු මත අභියාචනයට ඉඩ නොදීම,

කරනු ලැබිය හැකි ය.

(7) ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යම් විධානයක් නිකුත් කරනු ලැබීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දින දහහතරක කාලසීමාවක් ඇතුළත එකී විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, ඔහුගේ තීරණයෙන් අතෘප්තියට පත් තැනැත්තා වෙත ලේකම්වරයාගේ තීරණය සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වන සෑම දැන්වීමක්ම ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ අවසන් වරට පදිංචිව සිටි බවට සැලකෙන ස්ථානයේ ප්‍රදර්ශනය කරනු ලැබුවහොත්, එය ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) මේ පනතේ සඳහන් කිසිවක් නොතකා, වරදකරු යයි කියනු ලබන තැනැත්තා විසින් එම වරද සිදු කළ බවට පිළිගෙන, එම දඩය ගෙවනු ලැබූ අවස්ථාවක, එම වරද සම්බන්ධයෙන් යම් අධිකරණයක කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(10) ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය සන්නිවේදනය කළ දින සිට දින තිහක් ඇතුළත, නීතිය පිළිබඳ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

දඩය අය කර ගැනීම

**64.** (1) 63 වන වගන්තියේ (4) වන, (6) වන හෝ (10) වන උපවගන්තිය යටත් ලබා දෙන ලද තීරණයෙන් එක් මාසයක් ගතවීමෙන් පසු, එම තීරණය ලබා දෙනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා විසින් එම දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම තැනැත්තාට භාර දෙන ලද දැන්වීමේ සහ තීරණයේ සහතික කළ පිටපතක් ද සමඟ, එකී උල්ලංඝනය කිරීම සිදු වූ කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරන ලද ආකෘතියකින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඉන්පසු, මේ පනත යටතේ අය විය යුතු මුදල අය කර ගැනීම සඳහා ඔහුට විරුද්ධව වැඩිදුර නඩු නොපැවරිය යුත්තේ මන් ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස (1) වන උපවගන්තිය යටතේ වන දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ තැනැත්තා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු අතර, ප්‍රමාණවත් හේතු දැක්වීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එම මුදල, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සඳහා මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් එම තැනැත්තාට පනවනු ලැබූ දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එවිට, එවැනි වරදක් සඳහා පනවනු ලැබූ දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ විධිවිධාන (එහි (1) වන උපවගන්තියේ (අ) වන, (ඈ) වන සහ (එ) වන ඡේද හැර) අදාළ විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ උපවගන්තියේ විධිවිධාන අනුව, එම දණ්ඩන පනවන අවස්ථාවේ දී ඔහු විසින් කරනු ලැබිය හැකිව තිබූ යම් විධානයක් කරනු ලැබිය හැකි ය.

අතුරු තහනම් නියෝගයක් සඳහා ඉල්ලුම් කිරීම

**65.** යම් පුද්ගලයෙකු මේ පනතේ විධිවිධාන දිගටම උල්ලංඝනය කරන බවට විශ්වාස කිරීමට අධිකාරියට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක, එම පුද්ගලයා එවැනි ක්‍රියාවකින් වැළැක්වීමට අතුරු තහනම් නියෝගයක් ලබා ගැනීම සඳහා අධිකාරිය විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට අයදුම් කළ හැකි ය.

විශේෂඥ මණ්ඩලය

**66.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මණ්ඩලය සහ ලේකම්වරයා විමසා, සුදු ක්‍රීඩාව, නීතිය හෝ ගිණුම්කරණය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් තැනැත්තකුට මුදල් දඩයක් පැනවිය යුතු අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම එම විශේෂඥ මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(3) විශේෂඥ මණ්ඩලයට අමාත්‍යවරයා විසින් නියම කළ හැකි පරිදි වූ සේවා කොන්දේසිවලට යටත්ව සහ එවැනි නියම කළ හැකි පරිදි වූ ආකාරයට සහ ප්‍රමාණයකට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම

**67.** (1) අධිකාරියේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වූ ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම අනුමත කරන ලද්දා වූ ද අවස්ථාවක, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍යව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.

(2) (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා අධිකාරියට ගෙවිය යුතු යම් මුදලක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තා

**68.** (1) අධිකාරිය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක් ඇතුළත, අධිකාරිය විසින් සිදු කරන ලද කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පහත දැක්වෙන ලේඛන එම වාර්තාවට අමුණනු ලැබිය යුතු ය:-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟ වර්ෂය සඳහා අධිකාරියේ විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) එම වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම වන වර්ෂය සඳහා වන යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්.

(2) වාර්ෂික වාර්තාව ලැබුණු දින සිට මාස තුනක් ඇතුළත, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තයේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමඟ, එම වාර්තාව සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය

**69.** මණ්ඩලයේ සාමාජිකයන් සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින් ස්වකීය කාර්ය භාර ගැනීමට පෙරාතුව, අධිකාරියේ කටයුතුවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් කරනු ලැබිය යුතු අතර,

(අ) අධිකරණ නීතියක් විසින් එසේ කිරීමට නියම කර ඇති විට; හෝ

(ආ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන කිසිවකට අනුකූලව කටයුතු කිරීම සඳහා,

හැර, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණාවක් හෙළිදරව් නොකිරීමට එම ප්‍රකාශයෙන් ප්‍රතිඥා දෙනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා වන ආරක්ෂාව

**70.** මේ පනත යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ හෝ මණ්ඩලයේ විධාන මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා අධිකාරියේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිලධරයකු හෝ සේවකයකු හෝ එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු එම ක්‍රියාව තමා සද්භාවයෙන් කළ බවට ද, නිසි උද්යෝගයෙන්, සාධාරණ සැලකිල්ලකින් සහ කුසලතාවයකින් කටයුතු කළ බවට ද ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන

**71.** (1) අමාත්‍යවරයා විසින්, අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත ලිඛිතව සාමාන්‍ය විධාන නිකුත් කරනු ලැබිය හැකි ය. එම විධානවලට අනුකූලව කටයුතු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, කලින් කල, තමා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින්, අධිකාරියේ දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමා වෙත

සපයන ලෙස අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි ය. එම විධානවලට අනුකූලව කටයුතු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරියේ බලතල පැවරීම

**72.** අධිකාරිය විසින්, එකී නිලධරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරිය සතු හෝ අධිකාරියට පවරා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තකයකුට හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි ය. එවැනි යම් පැවරීමක් කර තිබුණ ද, එය නොතකා, එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**73.** අධිකාරිය 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**74.** අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තයන් දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරිය) අර්ථානුකූලව සහ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

වියදම් ප්‍රතිපූර්ණය කිරීම

**75.** (1) යම් අධිකරණයක දී අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත තමා විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී තමාට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් සහ එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම වියදම ඔහු විසින් අයකරගෙන ඇත්නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග

**76.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දෙන ලද හෝ නියම කරන ලද වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවලට අගතියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) සූදු ක්‍රීඩාවේ නිරතවීම සඳහා ඉල්ලුම්කරුවකුගේ යෝග්‍යතාව;

(ආ) ඉල්ලුම්පත්‍රයක් පිරිසැකසුම් කිරීම සඳහා අය කරනු ලැබිය යුතු ගාස්තු;

(ඇ) බලපත්‍ර වර්ග;

(ඈ) අඩු අවදානම් සූදු ක්‍රීඩා සේවාවන් සඳහා වන පන්ති බලපත්‍රය සහ පන්ති බලපත්‍රලාභියකුට අදාළ වන කොන්දේසි;

(ඉ) සූදු ක්‍රීඩා ස්ථානයක් සහ යම් ආනුෂංගික ගොඩනැගිල්ලක් වීම සඳහා ඕනෑම ස්ථානයක් හෝ පරිශ්‍රයක් යෝග්‍ය ද යන්න සහ සූදු ක්‍රීඩාව සම්බන්ධයෙන් සපයනු ලබන සේවාවන් සඳහා වන නිර්ණායක;

(ඊ) සුදු ක්‍රීඩා වෙළඳ දැන්වීම සඳහා වන සීමා;

(උ) සුදු ක්‍රීඩා යන්ත්‍ර භාවිත කිරීම සහ ඒ හා සම්බන්ධ වෙනත් කාරණා සඳහා වන නිර්ණායක; හෝ

(ඌ) සුදු ක්‍රීඩා යන්ත්‍ර සඳහා වන අනුමතයේ වලංගුභාවය, සුදු ක්‍රීඩා යන්ත්‍ර සම්බන්ධයෙන් වන කොන්දේසි, සුදු ක්‍රීඩා යන්ත්‍ර පැවරීම සම්බන්ධයෙන් වන සීමා සහ සුදු ක්‍රීඩා යන්ත්‍ර සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කිරීමේ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති

**77.** (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ රීති සෑදීමට බලය ලබා දී ඇති හෝ නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල සාමාන්‍යභාවයට අගතියක් නොවන පරිදි, අධිකාරිය විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ කටයුතු විධිමත් කිරීම; සහ

(ආ) අධිකාරියේ මුද්‍රාවේ භාරකාරත්වය සහ අධිකාරියේ මුද්‍රාව යොදන ආකාරය සඳහා විධිවිධාන සැලැස්වීම,

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු ලැබූ සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කිරීමෙන් පසු ක්‍රියාත්මක විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන සහ ඉතිරි කිරීම

**78.** (1) (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥාපනත, (46 වන අධිකාරය වූ) සූදු ආඥාපනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත් ඉවත් කරනු ලැබුව ද, එය නොතකා:-

(අ) (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සියලු ලියාපදිංචි සහතික, නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර නොකඩවා ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ සාදන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සියලු නියෝග, එම නියෝග මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට,

නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, එම නියෝග මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය;

(ඇ) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ කැසිනෝ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා නිකුත් කරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක පවතින්නා වූ ද සියලු බලපත්‍ර නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, නොකඩවා ක්‍රියාත්මක විය යුතු ය;

(ඈ) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත සහ (46 වන අධිකාරය වූ) සූදුආඥා පනත යටතේ පවරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින්නා වූ ද සියලු නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනතේ 4 වන වගන්තිය මගින් පිහිටුවන ලද අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරන ලද නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, නොකඩවා කරගෙන ගොස් අවසන් කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය

**79.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ:-

"කැසිනෝ ක්‍රීඩාව" යන්නෙන්, සමාන අවස්ථා නොවන අනපේක්ෂිත අවස්ථා ඇති ක්‍රීඩාවක් අදහස් වේ;

"ළමයා" යන්නෙන්, වයස් අවුරුදු දහඅටට අඩු තැනැත්තෙකු අදහස් වේ;

"ඩිජිටල් සූදු ක්‍රීඩාව" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් මාධ්‍යයක් භාවිත කරමින් සිදු කරන හෝ සිදු කිරීමේ හැකියාව ඇති යම් ආකාරයක සූදු

ක්‍රීඩාවක් අදහස් වන අතර, ඊට අන්තර් ක්‍රියාකාරී සූදු, අන්තර්ජාල සූදු ක්‍රීඩා, ජංගම සූදු ක්‍රීඩා, සමාජ සූදු ක්‍රීඩා හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල 18 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් මාධ්‍යයක් භාවිත කරමින් සිදු කරන හෝ සිදු කිරීමේ හැකියාව ඇති වෙනත් යම් ආකාරයක සූදු ක්‍රීඩාවක් ද ඇතුළත් වේ;

“සූදු ක්‍රීඩාව” යන්නෙන්, ඔට්ටු ඇල්ලීම, සූදු, මාර්ගගත සූදු, කැසිනෝ, සංචාරක නෞකා කැසිනෝ, විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම් අදහස් වන අතර, ඊට ඩිජිටල් සූදු ක්‍රීඩා, බකාරා, පුන්ටෝ බැංකෝ, බිග්සික්ස්, බ්ලැක් ජැක්, බූවලේ, චෙමින්ඩිෆර්, චක්-අ-ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, ෆාරෝ, ෆාරෝ බැන්ක්, හසාඩ්, පෝකර් ඩයිස්, පොන්ටූන්, ඇමරිකානු ප්‍රංශ රූලේ, ටේරන්ටේ-එට්-ක්වොරන්ටේ, විංගේ-එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන්, පුණ්‍ය හෝ පරාර්ථකාමී අරමුණු සඳහා වන සූදු ක්‍රීඩා හෝ අමාත්‍යවරයා විසින් කලින් කල 19 වන වගන්තිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රීඩාවක් ක්‍රීඩා කිරීම ද ඇතුළත් වේ;

“සූදු ක්‍රීඩා පරිශ්‍රය” යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය ද ඇතුළුව, යම් සූදු ක්‍රීඩාවක් ක්‍රීඩා කිරීම සඳහා, ගෙවීමක් කර හෝ ගෙවීමක් නොකර සහ අයිතිවාසිකමක් වශයෙන් හෝ අයිතිවාසිකමක් වශයෙන් නොමැතිව පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි යම් පරිශ්‍රයක් අදහස් වේ;

“විනෝද සවාරි සූදු ක්‍රීඩා” යන්නෙන්:-

(අ) යටත් පිරිසෙයින්, වැඩපිළිවෙළවලින් කොටසක් වශයෙන් හෝ විනෝද සවාරි සංවිධායකවරයකු විසින් යොදනු ලබන; සහ

(ආ) ශ්‍රී ලංකාවට ඇතුළු වන තැනැත්තා සඳහා වන ප්‍රවාහන, ආහාර සහ නවාතැන් පිරිවැය සියල්ල හෝ ඉන් කොටසක් කැසිනෝ බලපත්‍රයක් දරන්නා විසින් හෝ කැසිනෝ බලපත්‍රයක් දරන්නා වෙනුවෙන් ගෙවනු ලබන,

කැසිනෝ ව්‍යාපාරයක සූදු ක්‍රීඩාවේ යෙදීමේ මූලික අරමුණ ඇතිව සීමිත කාලයකට ශ්‍රී ලංකාවට ඇතුළුවීම අදහස් වේ;

“විනෝද සවාරි සූදු ක්‍රීඩා ගිවිසුම” යන්නෙන්, හවුල් ව්‍යාපාරයේ නියම සහ කොන්දේසි දක්වමින් සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවකු සහ විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම්කරුවකු අතර ඇති කර ගනු ලබන කොන්ත්‍රාත් ගිවිසුමක් අදහස් වේ;

“විනෝද සවාරි සූදු ක්‍රීඩා සංවිධායකවරයා” යන්නෙන්, සූදු ක්‍රීඩාකරුවන්ගේ ප්‍රවාහනය, නවාතැන් සහ විනෝදාස්වාදය සඳහා වැඩපිළිවෙළ යොදන හෝ පහසුකම් සලසන තැනැත්තකු අදහස් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, මුදල් විෂයය පවරා ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

“සමාජ සූදු ක්‍රීඩාව” යන්නෙන්-

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ නිවෙස හෝ වෙනත් යම් තැනැත්තකුගේ නිවෙස වන පරිශ්‍රයක දී සිදු කරනු ලබන;

(ආ) එකම පවුලේ සාමාජිකයන් වන හෝ එකිනෙකා පෞද්ගලිකව ම හඳුනන

තැනැත්තන් පමණක් සහභාගීවන්නන් ලෙස සිටින;

(ඈ) එය නිතිපතා, සිරිත් පරිදි හෝ ඊට සම්බන්ධ තැනැත්තන් අතර වන එකඟතාවක් මාර්ගයෙන් සිදු කරනු ලැබිය හැකි වුව ද, සැලකිය යුතු ලෙස ස්වයං සිද්ධ වන;

(ඇ) (i) සුදු ක්‍රීඩාවට සහභාගී නොවන යම් තැනැත්තකුගේ පෞද්ගලික වාසිය මගින් හෝ සඳහා; හෝ

(ii) යම් ව්‍යාපාරයක් කරගෙන යන අතරතුර දී,

ප්‍රවර්ධනය නොකරන, නැතහොත් සිදු නොකරන; සහ

(ඉ) සුදු ක්‍රීඩාවට සහභාගී වන්නකුට එම සුදු ක්‍රීඩාවේ ප්‍රතිඵලයක් ලෙස ලාභයක් හෝ වාසියක් හෝ වෙනත් යම් ප්‍රතිලාභයක් ලබාගත හැකි එකම මාර්ගය ජයග්‍රහණය කිරීම වන පරිදි සිදු කරනු ලබන,

දුරස්ථ නොවන සුදු ක්‍රීඩා අදහස් වන අතර, එයට පෞද්ගලික සහ වාණිජ නොවන සුදු ක්‍රීඩා ඇතුළත් වේ;

"නීති විරෝධී ක්‍රියාකාරකමක්" යන්නෙන්, මෙම පනතේ විධිවිධාන යටතේ වරදක් වන ඕනෑම ක්‍රියාවක් අදහස් වේ.

**80.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.